**බස්නාහිර පළාත් සභාව 2018**

**---------------------------------**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>තත්ත්වාගණනය කළ මතය</u>**

බස්නාහිර පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 14 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 06 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **<u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **<u>මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම</u>**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ

සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය. මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

  මාගේ විගණනය තුලදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 27 කට අදාල විසර්ජන ගිණුම්වල (සටහන (i)) ජංගම නොවන වත්කම් සංචලන වාර්තා අනුව 2018 දෙසැම්බර් 31 දිනට පැවති ස්ථාවර වත්කම්වල වටිනාකම රු.8,081,758,372 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හා ගිණුම් සටහන් මඟින් එම වටිනාකම හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුවේ. | ස්ථාවර වත්කම් ගිණුම් තැබීම මෙතෙක් රාජ්‍ය සේවයේ සිදුකර නොමැති අතර 2019 වර්ෂයේ අවසන් ගිණුම්වල වර්ෂයේ මිලදීගන්නා ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමට අදහස් කරයි. |

**1.6.2** **<u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ---------------------- |
| (අ) | විසර්ජන ගිණුම් අනුව සමාලෝචිත වර්ෂය තුළ ජංගම නොවන වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද වියදම හා අරමුදල් ගිණුම අනුව එම වියදම අතර රු.1,849,369,710 ක වෙනස්කම් පැවතුණි. | විසර්ජන ගිණුම් අනුව වියදම හා අරමුදල් ගිණුම අනුව වියදම සමාන වියයුතු වේ. | ඉදිරියේදී මේ සඳහා වත්කම් කළමනාකරණ මෘදුකාංගයක් හඳුන්වාදීමට නියමිතය. |
| (ආ) | ආදායම් ගිණුම් සාරාංශ අනුව ආදායම් සංකේත 06 කට අදාලව 2018 රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර රු.50,955,251 ක නොසැසඳීමක් පැවතුණි. | ගිණුම් සසඳා නිවැරදි ශේෂය ඇතුළත් කළ යුතු වේ. | භාණ්ඩාගාර පොත්වල සටහන් ශේෂයන් නිවැරදි වන අතර පළාත් මූල්‍ය රීති 307.3 ප්‍රකාරව ශේෂයන් නිරවුල් කරගන්නා මෙන් අදාල ආයතන දැනුවත් කර ඇත. |
| (ඇ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ (සටහන් (iii)) අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.1,233,836,341 ක් හා අරමුදල් ගිණුමේ අයවිය යුතු අග්‍රිම ශේෂය රු.1,233,182,956 ක් වූයෙන් රු.653,385 ක වෙනසක් පැවතුණි. | ගිණුම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අරමුදල් ගිණුමේ සටහන් කර ඇති ශේෂය නිවැරදි වේ. |
| (ඈ) | අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තුවක විසර්ජන ගිණුම්වල (සටහන් (iv)) ප්‍රේෂණ ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් භාණ්ඩාගාර පොත් යටතේ ප්‍රේෂණ ශේෂයක් නොමැති බව දක්වා තිබුණද, අරමුදල් ගිණුම අනුව එකී ආයතනවලට අදාලව රු.12,254,524 ක ශේෂයක් පැවතුණි. | ගිණුම් සසඳා ශේෂ නිවැරදි කරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඉ) | ප්‍රේෂණ ගිණුම්වල ආරම්භක ශේෂයන් පියවා තිබිය යුතු වුවත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ (සටහන් (iv)) ප්‍රේෂණ ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ රු.3,907,352 ක ආරම්භක ශේෂයක් පැවතුණි. | ගිණුම් සසඳා ශේෂ නිවැරදි කරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

**1.6.3 අග්‍රිම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ආයතන 14 කට අදාලව නිරවුල් නොකළ අග්‍රිම ශේෂ එකතුව රු.999,144,684 ක් විය. | ගිණුම් වර්ෂය අවසානයේ සියළු අග්‍රිම ශේෂ නිරවුල් කරගත යුතු වේ. | කාර්යාල 14 ශේෂ නිරවුල් කරමින් පවතී. |

**1.6.4 ප්‍රේෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ආයතන 19 කට අදාලව නිරවුල් නොකළ ප්‍රේෂණ ශේෂ එකතුව රු.15,494,887 ක් විය. | ප්‍රේෂණ ශේෂ නිරවුල් කළ යුතු වේ. | කාර්යාල 19 ශේෂ නිරවුල් කරමින් පවතී. |

**1.6.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2007 මැයි 11 දිනැති අංක 2007/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 වන වගන්තිය | නැවත සේවයේ යොදවනු ලැබූ විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප සමග නියමිත ජීවන වියදම් දීමනාව ගෙවන බැවින් නැවත ජීවන වියදම් දීමනාව ගෙවිය නොහැකි නමුත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් 04 දෙනෙකුට 2010 ජනවාරි 01 දින සිට 2018 ජනවාරි 31 දින දක්වා රු.813,404 ක මුදලක් ජීවන වියදම් දීමනා වශයෙන් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගත විය යුතු වේ. | 2007 මැයි 11 දිනැති අංක 2007/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 වන වගන්තියට අනුව සම්පූර්ණ ජීවන වියදම් දීමනාව ගෙවා නොමැත. |
| (ආ) | 2012 අංක 04 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තියේ 04(2) හා 06(3) වගන්ති | රජයේ ඉඩමක් ආණ්ඩුව විසින් ප්‍රයෝජනයට ගනු ලැබීම සම්බන්ධයෙන් පළාත් සභාවේ එකඟත්වය ලබාදීමේදී අනුගමනය කල | ක්‍රියාපටිපාටි රීති මඟින් නියම කළයුතු වේ. | අදහස් දක්වා නැත |

යුතු ක්‍රියාපටිපාටිය රීති මඟින්
නියම කර නොතිබුණි.

**2.** <u>ආදායම් කළමනාකරණය</u>

**2.1** <u>හිඟ ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් සංකේත 30 ක් යටතේ ආදායම් රැස්කර තිබූ අතර එයින් ආදායම් සංකේත 15 කට අදාල රු.2,878,588,181 ක හිඟ ආදායමක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. | හිඟ මුදල් අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් ශීර්ෂ 15 ට අදාල රු.2,598,249,351 ක හිඟ මුදලක් තවදුරටත් අයවීමට ඇත. |
| (ආ) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 15 රූඩ් 3 පර්චස් 38.5 ක ඉඩමක් 2003 පෙබරවාරි 28 දින සිට වර්ෂයකට රු. 79,200 ක මුදලකට බදු දී තිබුණි. බදු ගිවිසුම අනුව වාර්ෂික බදු වැඩිවීම සියයට 10 ක් වුවත් එම වැඩිවීම වූ රු.1,252,035 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික බදු වැඩිවීම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත |

**03.** <u>මූල්‍ය සමාලෝචනය</u>

**3.1** <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,322,890,536 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.401,630,872 ක් විය.

**3.2** <u>මූල්‍ය පාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජංගම ගිණුම්වල මුදල් රු.2,649,000,000 ක් එක් දින ආයෝජනයක් කර තිබූ අතර එම වටිනාකම කෙටිකාලීන ආයෝජන වශයෙන් නොපෙන්වා ජංගම ගිණුම් ශේෂ ලෙස දක්වා තිබුණි. | කෙටිකාලීය ආයෝජන වශයෙන් ගිණුම්වල පෙන්විය යුතු වේ. | අදහස් දක්වා නැත |

**4. <u>ප්‍රදාන ගිණුම් / අරමුදල් ගිණුම් / වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්</u>**

**4.1 <u>ප්‍රදාන ගිණුම්</u>**

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>----------------- |
|---|---|---|---|
| **(අ) <u>අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය</u>** | | | |
| (i) | 2010 වර්ෂයේ ඇති කළ කරදියාන කසළ අංගනය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් 2019 මැයි 08 දින ඉදිරිපත් කර තිබූ මූලික වාර්තාව අනුව කසළ බැහැර කරන ස්ථානයේ මීටර් 20 සිට මීටර් 70 අතර දුරකින් පිහිටි නිවාස 19 ක් සහිත භූමිය දැඩි අවදානම් සහිත ප්‍රදේශයක් ලෙස හා භූමිය තුළින් විෂ වායු ඇතිවීමට ඉඩ ප්‍රස්ථා පවතින බවද හඳුනාගෙන තිබුණි. 2007 අංක 1 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තියේ මූලික අරමුණුවලට අනුකූලව මෙම කසළ අංගනය කළමනාකරණය කර නොතිබුණු අතර ජාතික පරිසර පනතේ විධිවිධානයන් අනුව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව මෙය පවත්වාගෙන තිබුණි. | 2007 අංක 1 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරි ප්‍රඥප්තියේ මූලික අරමුණුවලට අනුකූලව කසළ අංගනය කළමණාකරනය කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ii) | ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රු.මිලියන 23.5 ක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අදාල කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට අධිකාරිය විසින් 2006 වර්ෂයේදී තීරණය කර තිබූ අතර ඒ සම්බන්ධව රු.මිලියන 90 ක වන්දියක් හා සියයට 11.3 ක නෛතික පොළිය ගෙවීමට බේරුම් කාරක මණ්ඩලය විසින් 2012 වර්ෂයේ තීරණය කර තිබුණි. ඒ සම්බන්ධව අධිකාරිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ අභියාචනය 2018 අගෝස්තු 31 දින නිෂ්ප්‍රභා කර තිබුණි. ඒ අනුව අදාල ආයතනය වෙත රු. මිලියන 111 ක් ගෙවීමට සිදුවී තිබුණි. | අදාල පරිපාටීන් අනුගමනය කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට ක්‍රියාකළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (iii) | 2011 සිට 2014 දක්වා වූ වර්ෂවල ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ කිහිපයක් මඟින් රන් අරුණ I,II,III වැඩසටහන් යටතේ මාර්ග කාපට් කිරීම හා දිවිනැගුම වැඩසටහන යටතේ සතිපොළ හා මාතෘ හා ළමා සායන | ලැබිය යුතු මුදල් අයකරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යස්ථාන ඉදිකිරීම් ඇතුළු ව්‍යාපෘති ඉටුකිරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු බවට ගිණුම් ගත කර තිබූ රු. මිලියන 3,224 ක් 2019 මැයි වන විටත් ලැබී නොතිබුණි. | | |
| (ආ) | **<u>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය</u>**<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අස්ගිරිය, මොරගහහේන හා රත්මලාන ප්‍රාදේශීය යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල මගින් යන්ත්‍ර කුලියට දීම හා අළුත්වැඩියා වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 33.5 ක් අය විය යුතුව පැවති අතර එම ශේෂය තුල 1996 වර්ෂයේ සිට පැවත එන ශේෂයන්ද පැවතුණි. විවිධ කරුණු හේතුවෙන් මෙම ශේෂයන් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | ලැබිය යුතු මුදල් අයකරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | **<u>කෘෂි සේවා අධිකාරිය</u>**<br>ශ්‍රම සවිය වැඩසටහන යටතේ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2018 අගෝස්තු 15 දින අනුමත කර තිබූ රු.ලක්ෂ 75 ක මුදලින් 2018 වර්ෂයේ අයවැය යෝජනාවලට ඇතුලත් කර නොතිබූ කෘෂි කාර්මික භාණ්ඩ මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර රු.7,436,845 ක් ගෙවා තිබුණි. එම මිලදී ගැනීම තුළ රු.596,625 ක් වටිනා තණකොළ කපන යන්ත්‍ර 35 ක් ඇතුළත්ව තිබුණි. එසේම 2019 ජනවාරි 11 දින නැවතත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තණකොළ කපන යන්ත්‍ර 85 ක් රු.1,705,500 කට මිලදීගෙන තිබූ අතර මිලදීගෙන තිබූ තණකොළ කපන යන්ත්‍ර 100 ක් "සිතමු" ව්‍යාපෘතිය යටතේ සභාපති විසින් තෝරාගන්නා ලද පිරිසකට බෙදාහැර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීමට හේතු හා තණකොළ කපන යන්ත්‍ර බෙදාහැරීමේ විස්තර ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

## 4.2 <u>අනෙකුත් අත්තිකාරම් ගිණුම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | -------------------- |
| (අ) | ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට වෙනත් පළාත් සභා 8කට ස්ථාන මාරු වී ගොස් තිබෙන නිලධාරීන් 48 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල වටිනාකම රු.3,825,170 ක් විය. | වෙනත් පළාත් සභාවලට ස්ථාන මාරුවීමේදී ණය ශේෂ අයකර ගැනීමට ක්‍රමවේදයක් සැකසිය යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට, වැඩ තහනම් කර ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 ට | ණය ශේෂ අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

අයවිය යුතු ණය ශේෂය රු.47,725 ක් වූ අතර එම ශේෂය අවුරුදු 4 ට වඩා පැරණි විය.

**5. <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**5.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ කොට්ඨාශ 04 ක් සඳහා මසකට රු.55,000 බැගින් 2018 හා 2019 වර්ෂ සඳහා පිළිවෙලින් රු.850,500 ක් හා රු.628,750 ක් වශයෙන් කුලී ගෙවා මසකට දින 4 ක කාර්යාල කටයුතු වෙනුවෙන් ස්ථාන ලබාගෙන තිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන රජයට අවම පිරිවැයක් හා උපරිම ප්‍රතිලාභ යටතේ කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | අඩක් නිම කළ මතුගම අධ්‍යාපන කලාපයේ ව්‍යාපෘතියක් සඳහා වෙන් වූ රු.7,500,000 ප්‍රතිපාදන වෙනත් ඉදිකිරීම් සඳහා යොදවා තිබුණි. | අවශ්‍යතාවයන් අනුව ප්‍රතිපාදන වැයකළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල හෙක්ටයාර 1.5 කට අයත් ඉඩම් කැබලි 10ක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීමට 2014 – 2017 කාලය තුල පළාත් ඉඩම් කොමසාරිස් අනුමැතිය ලබා දී තිබූ නමුත් මේ දක්වා එම ඉඩම් බදු දීමට කටයුතු කර නොතිබූ අතර දීමනා පත්‍ර ES 57 සහ ES 49 යටතේ ඇති අක්කර 01 රූඩ් 02 ක භූමියක් අනවසරයෙන් භුක්ති විඳිමින් තිබුණි. | ඉඩම බදුදීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඈ) | ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ නව ගොඩනැගිල්ලේ මධ්‍යම වායු සමීකරණ පද්ධතිය 2017 වර්ෂයේදී රු.518,623 ක් සහ 2018 වර්ෂයේ සැප්තැම්බර් දක්වා රු.1,720,503 ක් ගෙවා අළුත්වැඩියා කර තිබුණි. රෝහල සතු අනෙකුත් වායු සමීකරණ 120 අතුරින් ක්‍රියාකාරී මට්ටමේ පැවති යන්ත්‍ර සංඛ්‍යාව 65 ක් පමණ විය. 2018 සැප්තැම්බර් | වායුසමීකරණ පද්ධතිය සක්‍රීය කරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | වනවිට වායු සමීකරණ යන්ත්‍ර 32 ක් ක්‍රියා විරහිත වී තිබූ අතර මින් 23 ක් තවදුරටත් අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව අනාවරණය විය. | | |
| (ඉ) | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් ගම්පහ දිස්ත්‍රික් මහා රෝහලේ රුධිර කාන්දු කරන ඒකකය සඳහා Dialysis Machine 04 ක්, Ro Plant 01ක්, Dialysis Bed 02 ක් 2017 ජූනි 27 වන දින ලබාදී තිබුණි. 2018 සැප්තැම්බර් 14 දින වන විටත් ඒකකය පිහිටුවා නොතිබුණෙන් රෝහලේ ඉල්ලීමකින් තොරව ලබාදී තිබූ මෙම උපකරණ සහිත පෙට්ටි නව ගොඩනැගිල්ලේ 6 වන මහලේ කොරිඩෝවේ අනාරක්ෂිත ලෙස තබා තිබුණි. ඇසුරුම් කඩා නොතිබුණ මෙම උපකරණ වල වගකීම් කාලය භාවිතා කිරීමකින් තොරව අවසන්වී තිබුණි. එමෙන්ම ඒකකයේ කටයුතු කිරීම සඳහා වෛද්‍ය නිලධාරීන් තිදෙනෙක්, හෙද නිලධාරීන් 2 ක් හා කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ එක් අයෙකු පුහුණු කර ඇති බවද අනාවරණය විය. | මෙම උපකරණ රෝගීන්ට සේවා සැලසීම සඳහා කඩිනමින් යොදවා ගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

## 5.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ------------------------------ |
| (අ) | වටිනාකම රු.534,721 ක කල් ඉකුත් වූ ඖෂධ වර්ග 08 ක් මීගමුව දිස්ත්‍රික් මහා රෝහලේ ගබඩාවේ තැන්පත් කර තිබුණු අතර එම ඖෂධ බැහැර කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කල් ඉකුත් වූ ඖෂධ කඩිනමින් බැහැර කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2019 මුල් කාර්තුවේදී අපහරණ මණ්ඩලයක් මගින් මෙම ඖෂධ අපහරණය කිරීමට කටයුතු කරයි. |
| (ආ) | වතුපිටිවල රෝහලේ කල් ඉකුත්වීම් හා වේයන්ගෙන් සහ මීයන්ගෙන් හානි වීම හේතුවෙන් 2018 ජූලි 20 සහ 21 දිනයන්හිදී අපහරණය කරන ලද ඖෂධ තොගයේ වටිනාකම රු.1,260,821 ක් විය. | ඖෂධ කල්ඉකුත්වීමට පෙර අවශ්‍ය රෝහල්වලට ලබාදීමට වැඩපිළිවෙලක් තිබිය යුතු වේ. | අදහස් දක්වා නැත. |

## 5.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------- |
| (අ) | ආණ්ඩුකාරවරයාගෙන් ලබාගත් අනුමැතිය මත විධායක ශ්‍රේණියේ නිලධාරීන් 11 දෙනෙකුට නිල නිවාස කුලී වශයෙන් මාසිකව රු.30,000 බැගින් ගෙවා තිබූ අතර 2017 නොවැම්බර් සිට 2019 අප්‍රේල් දක්වා රු.5,340,000 ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන්ගෙන් 10 දෙනෙකු බස්නාහිර පළාත තුළ පදිංචි අය වූ අතර මින් 08 දෙනෙකු සිය ස්ථිර නිවාසවල පදිංචි අය වූහ. | පළාත තුළ පදිංචි නිලධාරීන්ට නිල නිවාස කුලී ගෙවීම අවිධිමත් වේ. | පළාත් ආණ්ඩුකාරතුමාට දීමනා අනුමත කිරීමේ බලයක් ඇත. |
| (ආ) | බප/ජය/මාලඹේ ශ්‍රී රාහුල බාලිකා මහා විද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් 2015 හා 2016 වෙළඳපොල ව්‍යාපෘතිය මගින් පිළිවෙලින් රු.1,869,759 ක් හා රු.1,433,206 ක් වශයෙන් රු.3,255,575 ක මුදලක් උපයාගෙන තිබුණි.එම මුදල් ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීමට වැය නොකර වෙනත් කටයුතු සඳහා වැයකර තිබූ නමුත් වැය කිරීමට අදාල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | උපයාගත් මුදල් අපේක්ෂිත අරමුණු සඳහා යෙදවිය යුතු වේ. | නිසි අනුමැතිය නොමැතිවීම මත මුදල් වෙනත් කටයුතුවලට යොදා ඇත. |

## 5.4 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------- |
| (අ) | මාර්ග අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය තුළ මාසිකව රු.මිලියන 01 සිට මිලියන 104 දක්වා අසාමාන්‍ය මුදල් ශේෂයක් ජංගම ගිණුමක පවත්වා ගෙන ගොස් තිබුණි. | අතිරික්ත මුදල් පළාත් භාණ්ඩාගාරයට යැවිය යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | ගම්පහ දිස්ත්‍රික් මහා රෝහලේ ආපන ශාලාව පවත්වාගෙන යාමෙන් 2014 සිට 2017 වර්ෂය දක්වා ලැබුණු රු. 4,754,800 ක මුදලින් රෝහලේ ආපන ශාලාව අළුත්වැඩියා කිරීමට 2017 ටෙන්ඩර් ඇගයීම් කමිටුව විසින් යෝජනා කර තිබුණද, 2018 | අදාල අරමුදල් ඵලදායී කටයුත්තකට යොදවා ගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | සැප්තැම්බර් වන විටත් ආපන ශාලාව අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට අයත් නිල නිවස ඉවත්කර ඒ වෙනුවට නිල නිවසක් ඉදිකිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 ජූලි 31 දින ලබාදී තිබුණු රු. 4,100,000 ක මුදල තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාල මුදල් අරමුණුගත කටයුතු සඳහා යෙදවිය යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | පානදුර මූලික රෝහලේ ආපන ශාලාව 2014 සිට 2017 දක්වා කාලය තුල බදුදීමෙන් උපයාගෙන තිබූ රු. 1,524,871 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාල මුදල් ඵලදායී කටයුතු සඳහා යෙදවිය යුතු වේ. | අදහස් දක්වා නැත. |

## 5.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉංජිනේරු කාර්යාංශයේ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ ගණකාධිකාරී තනතුරක් නොතිබියදී 2013 වසරේ සිට මසකට රු.7,500 බැගින් පිළිවෙලින් රු.7,020,000 ක හා රු.1,462,500 ක මුදලක් වැඩ බැලීම සඳහා ගෙවා තිබුණි. මෙහිදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයාට එහි ප්‍රාදේශීය කාර්යාලයේ වැඩ බැලීම සඳහා 2013 සිට 2018 දක්වා රු.405,000 ක් ගෙවා තිබුණි. | වැඩ බැලීමේ පත්කිරීමක් කිරීම සඳහා අනුමත තනතුරක පුරප්පාඩු පැවතිය යුතු වේ. | අධික වැඩ ප්‍රමාණයක් පවතින බැවින් සේවය ලබාගෙන මෙම මුදල් ගෙවා ඇති බව. |

## 5.6 හඳුනාගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන අනතුරු සම්බන්ධයෙන් වූ හානිවලට රියදුරු වගකිව යුතු අවස්ථාවන්හිදී එම පාඩුව රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම නිසා වාහන 07 කින් රජයට සිදුව තිබූ රු.301,273 ක පාඩුව පොත් වලින් කපා හැරීමට සිදු වී තිබුණි. තවද වාහන අනතුරු 05 කට අදාලව සිදුව තිබූ | අයකර ගැනීම්වලට අදාල ක්‍රියාවලිය කඩිනම් කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

රු.1,514,167 ක පාඩු රක්ෂණ ආවරණයෙන් හෝ තුන්වන පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීම සහ කටයුතු කිරීම ප්‍රමාද කිරීම හේතුවෙන් කාලාවරෝධයට ලක් වීම නිසා අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

**5.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ජුනි 14 දින ගිවිසුම්ගත වටිනාකමින් සියයට 30 ක් වශයෙන් රු.6,590,273 ක අත්තිකාරම් මුදලක් ගෙවා ගම්පහ දිස්ත්‍රික් මහා රෝහලේ මෘත ශරීරාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් ආයතනයකට පවරා තිබුණි. ගොඩනැගිල්ලේ ඉදිරිකිරීම් අවසන් කිරීමට නියමිත කාලය ඉකුත්වී වර්ෂයකට ආසන්න කාලයක් ගතවී තිබුණද, අත්තිවාරම පමණක් දමා ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර තිබුණි. 2016 දෙසැම්බර් 16 දිනැති ඇප බැඳුම්කරය මුදල් කර ගැනීමට නොහැකිවීම නිසා කළවැඩ වටිනාකම වූ රු.2,673,327 ක් අඩුකිරීමෙන් පසු රු.3,916,946 ක ඉතිරි මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | වගකිව යුතු අයවලුන්ට එරෙහිව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**5.8.1 ප්‍රමාද වූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළුතර අධ්‍යාපන කලාපයේ 2016, 2017 වර්ෂවල ආරම්භ කර 2017 වර්ෂය අවසන් වීමට පෙර අවසන් කිරීමට ගිවිසගෙන තිබුණු පාසල් 10ක ගොඩනැගිලි ඉදිකිරීම්වල කාලය අසාමාන්‍ය ලෙස දීර්ඝ කිරීම් කර තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | ඉදිකිරීම්වල ප්‍රගතිය සොයාබලා ඉක්මනින් අවසන් කරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.8.2 අත්හැර දැමූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු සිදුකර කරගෙන | අඩුපාඩු නිවැරදි ඉදිකිරීම් | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම විධිමත් පරිදි සිදු නොකිරීම නිසා කළුතර දිස්ත්‍රික්කයේ ශාන්ත මේරි මහා විද්‍යාලයේ සහ ධර්මරාජ කණිෂ්ඨ විද්‍යාලයේ රු. මිලියන 98.3 ක ගොඩනැගිලි 3ක් ඉදිකිරීම් වෙනුවෙන් මුල්ගල් තබා ඉදිකිරීම් අතහැර දමා තිබුණි. | අවසන් කළ යුතු වේ. | |
| (ආ) | පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.42,800,110 ක ඇස්තමේන්තු වටිනාකමකට භාරගෙන තිබූ තිනියාවල සායන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණි. කළවැඩ වටිනාකම රු.4,225,167 ක් මත රු. 236,871 ක් කොන්ත්‍රාත් ආයතනයකට ගෙවා තිබූ නමුත් ව්‍යාපෘතියේ කටයුතු අතරමග නතරකර තිබුණි. | ප්‍රගතිය සොයාබලා නොපමාව අවසන් කරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | පළාත් සභා ප්‍රතිපාදන යටතේ 2015 වර්ෂයේදී පාලින්දනුවර ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා රු. 1,100,000 ක මුදලක් රිකිලි තේ ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය ආරම්භයේදීම අසාර්ථක වී තිබූ අතර මේ සඳහා යොදාගෙන තිබූ පොලිතින් දැල් ආවරණ ආදිය අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. | ව්‍යාපෘතිය සක්‍රිය කරගැනීමට කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | දොඩංගොඩ තෙබුවන අරප්පලකන්ද වත්තේ මාබොඩ කොටසේ ජනතාවට පානීය ජලය ලබාගැනීම සඳහා 2017 වර්ෂය තුල රු.398,630 ක් වැයකර පොදු ළිඳක් කපා තිබුණි. එහෙත් අනෙකුත් කටයුතු සඳහා ප්‍රතිපාදන නොලැබීම නිසා ව්‍යාපෘතියේ කටයුතු නතරවී තිබුණි. | ප්‍රතිපාදන ලබාගෙන ඉදිරි කටයුතු සිදුකළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.9 වත්කම් කළමනාකරණය**

**5.9.1 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ------------------------------ |
| (අ) | ගම්පහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පාලනය වන රෝහල්, බෙහෙත් ශාලා සහ සායන 200 ක් අතරින් ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, රෝහල් 02 ක්, මධ්‍යම බෙහෙත් ශාලා 04 ක් සහ සායන 01 ක පමණක් ඉඩම් අයිතිය තහවුරු කරගෙන තිබූ අතර ආයතන 04 කට අදාලව පමණක් පවරා ගැනීමේ කටයුතු කරමින් පැවතුණි. තවද, පවරා ගැනීමට කටයුතු කලයුතු එහෙත් මැනුම් කටයුතු හෝ සිදුකර නොතිබූ රෝහල්, බෙහෙත්ශාලා සහ සායන සංඛ්‍යාව 150 ක් පමණ විය. | පවරා ගැනීම් කඩිනම් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | හෙක්ටයාර 1.978 ක වපසරියකින් යුතු මිනුවන්ගොඩ මූලික රෝහල 1954 වර්ෂයේදී රෝගී සත්කාරක සේවාව ආරම්භ කර තිබුණ ද භූමිය සඳහා විධිමත් පරිදි පවරාගෙන නොතිබුණි. | පැවරුම් ඔප්පුවක් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.9.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ------------------------------ |
| (අ) | ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ මූලික ප්‍රතිකාර ඒකකය තුල 2000 වර්ෂයේදී ස්ථාපිත කරන ලද එක්ස්-කිරණ (X- Ray) යන්ත්‍රය වසර 3 ක පමණ කාලයක සිට අක්‍රීයව පැවතුණි. මූලික ප්‍රතිකාර ඒකකයේ ඇති ජංගම එක්ස්-කිරණ (mobile X- Ray) යන්ත්‍ර 2 න් එකක් වර්ෂ ගණනාවක සිට ක්‍රියා විරහිතව පවතින අතර දන්ත ඒකකය තුළ ඇති එක්ස්-කිරණ (X- Ray) යන්ත්‍ර 2 න් එකක් වර්ෂයක පමණ කාලයක සිට අක්‍රීයව පැවතුණි. | භාවිතයට ගත නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ විශේෂ ළදරු සත්කාර ඒකකයේ අවශ්‍යතාවයන් සඳහා ලබාදී ඇති Ventilator 04 න් එකක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. තවද 2017 ජනවාරි 20 දින ලැබී තිබුණු මුව වැසුම් 480 ක්, 2017 මාර්තු 08 දින ලැබුණු හෙදි ගවුම් 434 ක්, 2017 වර්ෂයට පෙර ලැබී තිබුණු හිස්වැසුම් 50 ක් හා අත්තුවා 70 ක්, ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබූ අතර 2017 හා 2018 වර්ෂවල පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මෙට්ට 139 ක් වහලය කැඩුණු තහඩු ගබඩාවක අසුරා තිබුණි. | භාවිතයට ගත නොහැකි භාණ්ඩ අපහරණයට හා අනෙකුත් භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අළුත්වැඩියාව සඳහා යොමුකර තිබූ වාහන 04 කට එම අධිකාරිය විසින් ලබාදී තිබූ ඇස්තමේන්තු අනුමත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂ 3-8 දක්වා වූ දීර්ඝ කාලයක සිට එම වාහන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අංගනයේ දිරාපත් වෙමින් පැවතුණි. | අදාල ආයතනවල වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඈ) | මිනුවන්ගොඩ මූලික රෝහලේ රසායනාගාරයට 2015 වර්ෂයේදී ලැබී ඇති 3 Part Ha matology එකක් , Semi – Auto mated Biochemistry Analyzer එකක් සහ 1000 VA Isolation Transformer එකක් භාවිතා නොකිරීම නිසා ඇසුරුම් තුලම පැවති අතර මේවායේ වගකීම් කාලය ඇසුරුම් තුලදීම අවසන් වී තිබුණි. තවද පොදු භාණ්ඩ ලේඛනය අනුව වර්ෂ 04 ත් 06 ත් අතර කාලයක ලැබී තිබූ භාණ්ඩ වර්ග 5 කට අයත් ඒකක 248 ක් නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | අදාල යන්ත්‍ර ස්ථාපිත කර රෝගීන්ට සේවා සැපයීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඉ) | හොරණ මූලික රෝහලට 2014 ජනවාරි මාසයේදී ලැබී තිබුණු රු. 3,288,800 ක් වටිනා Exercise ECG යන්ත්‍රය මේ දක්වා භාවිතයට | ECG යන්ත්‍රය නිෂ්ක්‍රීයවීමට ඉඩ නොතැබිය යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | ගෙන නොතිබුණි. | | |
| (ඊ) | මතුගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ 2016 ජුනි මස සිට ගබඩා කර ඇති භාවිතයට නොගන්නා මෝටර් සයිකල් 19 ක් පැවතුණි. | අපහරණය කිරීමට ගැනීමට හෝ භාවිතයට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.9.3 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | -------------------------- |
| පානදුර මූලික රෝහලට ලබාදී තිබූ ගිලන් රථයක් 2013 ජනවාරි මාසයේදී රු.748,200 ක් වැයකර එන්ජිම අළුත්වැඩියා කර කිලෝ මීටර 3,336 ක් ධාවනයෙන් පසු 2013 ඔක්තෝබර් මාසයේදී ධාවනයෙන් ඉවත්කර තිබුණි. | ධාවනයෙන් ඉවත් කිරීමට හේතු සොයාබලා නොපමාව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

**5.10.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | -------------------------- |
| කාර්යාලයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සියළු නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වේ. එහෙත් 2017 දෙසැම්බර් 31 දිනට වසර 05 කට වැඩි සේවා කාලයක් එකම ස්ථානයේ සේවය කරන නිලධාරීන් 1,357 දෙනෙකු සිටින නමුත් නිලධාරීන් 302 කට පමණක් ස්ථාන මාරුවීම් ලබාදී තිබුණි. අභියාචනා කමිටු තීරණවලට අනුව නිලධාරීන් 125 කගේ මාරුවීම් අවලංගු කර තිබූ අතර නිලධාරීන් 66 දෙනෙකුගේ මාරුවීම් ක්‍රියාත්මක වී නොතිබුණි. | චක්‍රලේඛවලට අනුගත විය යුතු වේ. | වයස අවු.55 සම්පූර්ණවී ඇති අයට මාරුවීම් සිදුකිරීම් අපහසුවීම් සහ ඉල්ලුම් කරන ලද නිලධාරීන්ට පමණක් මාරුවීම් ලබාදී ඇත. |

**5.10.2 පාසැල් කාර්ය මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ------------------------------ |
| (අ) | කළුතර අධ්‍යාපන කලාපයේ ගුරු පුරප්පාඩු 214ක් තිබියදී 2014 - 2018 අතර කාලය තුල විදේශ රැකියා සඳහා ගුරුවරුන් 09 දෙනකු නිදහස් කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළුතර අධ්‍යාපන කලාපයට අනුයුක්ත විදුහල්පතිවරයෙකු සහ ගුරු උපදේශකවරයකු පරිබාහිර වූ වෙනත් තනතුරුවලට 2015 – 2016 කාලය තුල මුදාහැර තිබූ අතර ඔවුන්ගේ වාර්ෂික කාර්යසාධන වාර්තා අනුයුක්ත ආයතනයෙන් ලබා නොගෙන 2015 සිට 2018 දක්වා කාලය තුල වැටුප් හා දීමනා ලෙස රු.1,355,145 ක් ගෙවා තිබුණි. | කාර්යසාධන වාර්තා ලබාගෙන ගෙවීම් කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට ගම්පහ අධ්‍යාපන කලාපයේ ගුරු තනතුරු 42 ක් හා විදුහල්පති තනතුරු 51 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඈ) | මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත තනතුරු 6 ක පුරප්පාඩු 17 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඉ) | මීගමුව අධ්‍යාපන කලාපයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් 24 ක ගුරු පුරප්පාඩු (ප්‍රාථමික, ද්විතියික, උසස් පෙළ ඇතුලුව) 215 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඊ) | මීගමුව අධ්‍යාපන කලාපයේ පාසල්වල අනුමත තනතුරු 5 ක පුරප්පාඩු 264 ක් හා එක් තනතුරක 07 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා විධිමත් ගුරු තුලනයක් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (උ) | මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු 2 ක් සඳහා 155 දෙනෙකු ස්ථිර පදනමින් බඳවාගෙන තිබුණි. | තනතුරු විධිමත් කරගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.10.3** <u>සෞඛ්‍ය කාර්ය මණ්ඩලය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------- | ------------------------- |
| (අ) | කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 10 ක මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 37 ක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 8ක පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් 89 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | මහජනතාවට සතුටුදායක ලෙස සේවා සැපයීමට නොහැකිව තිබුණි. | | |
| (ආ) | කළුතර දිස්ත්‍රික්කයේ මූලික රෝහල් ඇතුළු ආයතනවල පවතින වෛද්‍ය උපකරණ අළුත්වැඩියාව, නඩත්තුව සහ දෝෂ රහිතව පවත්වාගෙන යාමේ අරමුණෙන් වාද්දුව ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය ස්ථාපිත කර තිබුණද ආයතනයේ ඉංජිනේරු තනතුරු 3 ක් ඇතුළු අත්‍යාවශ්‍ය තනතුරු 07 ක පුරප්පාඩු 12 ක් පැවතීමෙන් බාහිර ආයතනවලට මුදල් ගෙවා සේවාවන් ඉටුකර ගැනීමට සිදුව තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඇ) | මීගමුව දිස්ත්‍රික් මහා රෝහලේ හෙද නිලධාරීන් 258 ක්, හා කාර්යාල කාර්ය සහායක සේවකයින් 132 ක් වසර 5 සිට 30 දක්වා කාලයක් සේවය කරමින් තිබුණි. තවද උපස්ථායක සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ 35 කින් 24 දෙනෙකු වසර 5 සිට 24 දක්වා කාලයක් මෙම රෝහලේම සේවය කර තිබුණි. | ස්ථානමාරු චක්‍රලේඛ අනුව කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඈ) | ගම්පහ දිස්ත්‍රික් මහා රෝහලේ සේවකයින් 18 ක් 2015,2016 හා 2017 යන වර්ෂ තුනෙහිම වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබූ අතර එය වර්ෂයකට උපරිමය දින 149 දක්වා විය. තවද වර්ෂ 3 ක කාලයක් තුල සුළු සේවකයින් 147 දෙනෙකු වැටුප් රහිත නිවාඩු දින 4005 ක් ලබාගෙන තිබුණි. | දිගින් දිගටම වැටුප් රහිත නිවාඩු ලබාගන්නා සේවකයින් පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඉ) | ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂ තනතුර වර්ෂ 5 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතෙන අතර තාවකාලික පදනම මත වරින් වර වැඩ බලන අධ්‍යක්ෂවරු පත් කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඊ) | ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ 2018 සැප්තැම්බර් වන විට තනතුරු 26 ක පුරප්පාඩු 58 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (උ) | මීගමුව දිස්ත්‍රික් මහා රෝහලේ සේවය කරන නිලධාරිනියන් 16 ක් 2017 වර්ෂයේ වැටුප් රහිත, ප්‍රසූත නිවාඩු | නීතිමය අවශ්‍යතාවයන් අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | ලබාගැනීමේදී වැන්දඹු හා අනත්දරු අරමුදල් දායකය අය කර නොතිබුණි. | | |
| (ඌ) | මීගමුව දිස්ත්‍රික් මහා රෝහලේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු වර්ග 30 ක පුරප්පාඩු 117 ක් හා තනතුරු වර්ග 3 ක අතිරික්ත කාර්ය මණ්ඩලය 6 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (එ) | වතුපිටිවල රෝහලේ තනතුරු වර්ග 18 ක 42 කගේ පුරප්පාඩු හා තනතුරු වර්ග 5 ක 17 කගේ අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඒ) | මීනුවන්ගොඩ මූලික රෝහලේ තනතුරු 11 ක පුරප්පාඩු 31 ක් හා තනතුරු 6 ක අතිරික්ත 15 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ඔ) | ඩෙංගු මදුරු මර්ධනය සඳහා අවශ්‍ය වාහන සපයා නොතිබියදී කළුතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 7ක් සඳහා රියදුරන් 8 දෙනකු අනුයුක්ත කර තිබුණි. මෙම රියදුරන් වෙනත් කාර්යයන් සඳහා හෝ යොදාගෙන නොතිබීම නිසා 2018 වර්ෂය තුලදී ඔවුන් වෙත වැටුප් හා දීමනා ලෙස ගෙවූ රු.2,293,598 ක මුදල සේවා නොලබා දැරූ වියදමක් විය. | රියදුරන් නියමිත රාජකාරි සඳහා යොදවා ගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

**5.11** <u>පළාත් පාලන බල මණ්ඩල කටයුතු අධීක්ෂණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නව වන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පළාත් පාලන ආයතන අධීක්ෂණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැකසිය යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව පළාත් පාලන බල මණ්ඩල 49 ක හිඟ ආදායම රු.9,805,922,887 ක් විය. | හිඟ ආදායම්අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

| | | |
|---|---|---|
| (ඇ) | කොළඹ මහා නගර සභාවේ නිලධාරීන්ට සහ සභිකයින්ට එරෙහිව පනවන ලද අධිභාර 29 කට අදාලව 2018 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු වටිනාකම රු.34,111,061 ක් විය. | අධිභාර මුදල් වගකිව යුතු අයවලුන්ගෙන් අයකර ගත යුතු වේ. |

**6. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

**6.1 <u>පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රෝහල් පරිශ්‍රය පිරිසිදුව, අලංකාරව සහ ක්‍රමවත්ව තබා ගැනීම වෙනුවෙන් මීගමුව මහ රෝහල මඟින් පෞද්ගලික ආයතනයක් වෙත මසකට රුපියල් ලක්ෂ 16 සිට 18 දක්වා මුදල් ප්‍රමාණයක් වැය කරනු ලැබුවත් රෝහල් පරිශ්‍රය පුරාම අපිළිවෙල හා අපිරිසිදු බව දක්නට ලැබුණි. | රෝහල් පරිශ්‍රය පිරිසිදුව තබා ගැනීමට පියවර ගත යුතු වේ. | අදහස් දක්වා නැත. |

**6.2 <u>තිරසර සංවර්ධන අරමුණු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව පළාත් සභාව දැනුවත්ව සිටියත්, එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් පළාත් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිතව වගකීම් පවරා නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු ළඟාකර ගැනීම සඳහා සැලසුම් සැකසිය යුතු වේ. | අදහස් දක්වා නැත. |